ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2000 අංක 30 දරන ජාත්‍යන්තර මිත්‍රත්ව, අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජසේවා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2000 ජූලි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 ජූලි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 යි.  තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

## 2000 අංක 30 දරන ජාත්‍යන්තර මිත්‍රත්ව, අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජසේවා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2000 ජූලි මස 19 වන දින.]

එල්. ඩී.—ඕ. 39/98.

### ජාත්‍යන්තර මිත්‍රත්ව, අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජසේවා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"ජාත්‍යන්තර මිත්‍රත්ව, අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජසේවා සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් එකී ආයතනයේ සාමාජිකයන් විසින් එකඟවන ලද රීතිවලට අනුකූලව එකී ආයතනයට සම්බන්ධ සියලු කටයුතු ඵලදායී ලෙස කරගෙන යාම සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී ආයතනය සංස්ථාගත කරනමෙන් එය ඉල්ලා ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඩු නාමය.

1. මේ පනත 2000 අංක 30 දරන ජාත්‍යන්තර මිත්‍රත්ව, අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජසේවා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාත්‍යන්තර මිත්‍රත්ව, අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජසේවා සංගමය සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාත්‍යන්තර මිත්‍රත්ව, අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජසේවා සංගමයෙහි සාමාජිකයන් වශයෙන් දැනට සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාත්‍යන්තර මිත්‍රත්ව, අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජසේවා සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාපිත නමින් සංස්ථාව විසින් ද, සංස්ථාවට විරුද්ධව ද නඩු පැවරිය හැකි වන්නේ ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ලෝකයේ සියලු ප්‍රජාවන් අතර මිත්‍රත්වය, සහෝදරත්වය, සහයෝගය වර්ධනය කිරීම ;

(ආ) ජාතික, ආගමික, වාර්ගික එකමුතුව ඇතිකිරීම සඳහා ක්‍රියා කිරීම, සහායදීම, සහ සමාජයේ පවත්නා ආගමික හා ජනවාර්ගික බෙදීම් දුරුකිරීමට අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කිරීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය, විදේශීය ආයතන සමඟ සම්බන්ධතා ඇතිකර ගැනීම ;

(ඈ) පොත් පත්, පුවත්පත්, සඟරා, ප්‍රකාශන, මුද්‍රණය, පළකිරීම, හා අලෙවිය සහ පුස්තකාල හා කියවීම් ශාලා ඇති කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාවෙහි හා විදේශයන්හි ආගමික, සංස්කෘතික, අධ්‍යාපනික හා සාමයික සම්මේලන සංවිධානය කිරීම ; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හා හිතකර සියලු දේ කිරීම.

සංස්ථාවේ බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය :—

(අ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන් පත්කිරීම, අස්කිරීම හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීම හා ඔවුනට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් සම්බන්ධයෙන් මනා විනය පාලනයක් පවත්වා ගෙන යාම ;

(ආ) ශ්‍රී ලංකාවෙහි හෝ විදේශයක ප්‍රභවයන්ගෙන් ප්‍රදාන හෝ පරිත්‍යාග ලබාගැනීම හෝ එකතු කිරීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා දේශීය හා විදේශීය ශාඛා පිහිටුවීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ විධායක මහා ලේකම්වරයාගෙන් සහ සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ ඒවාට අනුකූලව තෝරා පත්කර ගන්නා ලද වෙනත් නිලතල දරන්නන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීමට ;

(ආ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කලහැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාරගැනීමට, වට්ටම් දීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ පවත්නා නීතියට යටත්ව, ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ වැසීමට ;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් කළමනාකරණ මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට හා එවැනි අයෝජන කලින් කලට වෙනස් කිරීමට හෝ හුවමාරු කිරීමට ;

(ඈ) දායක මුදල්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ ත්‍යාග, ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයක සංස්ථාගත කළ යම් තැනැත්තෙක්, හෝ පුද්ගල මණ්ඩලයක් සමඟ හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, මණ්ඩලයක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක් සමඟ ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(ඊ) සංස්ථාවේ ප්‍රතිලාභය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී සේවක පිරිස් පුහුණු කිරීමට ද,

සංස්ථාවට බලය ඇත්තේ ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

7. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, යම් වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවාහරින අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් මෙතෙක් භාර ගන්නා ලද හෝ මින් මතු භාර ගනු ලබන ත්‍යාග, පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල් කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු කීපයක තැන්පත් කළ යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, පරිත්‍යාගයකින්, මුදල් පිළිබඳ නියාදනයකින් හෝ අන් ලෙසකින් සංස්ථාව සතුවන කවර වුවද චංචල හෝ නිශ්චල දේපළක් මෙම පනතේ විධිවිධානවලට යටත්ව භාරගැනීමට හා දැරීමට සංස්ථාවට හැකියාවක් තිබෙන අතර, එබඳු සියලු දේපළ තත්කාලයෙහි සංස්ථාවේ බලාත්විතව පවත්නා රීතිවලට යටත්ව ඒවා විකිණීම, බදුදීම, හුවමාරු කිරීම, හෝ අන් ලෙසකින් බැහැර කිරීමේ පූර්ණ බලතල සහිතව මෙම ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා සංස්ථාව විසින් ඒවා දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

10. සාමාජිකත්වය සඳහා ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් නෙරපීම, නිලතල දරන්නන් තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් වූ මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ රීති සංස්ථාවේ යම් මහාසභා රැස්වීමක දී ඊට ඡන්දය දෙන සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක ඡන්දයෙන් සංස්ථාව විසින් සාදනු ලැබිය හැකි ය. ඒ රීති සැදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

**11.** සංගමයේ මුද්‍රාව ගරු විධායක මහා ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර එය සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි අවශ්‍යකරන අවස්ථාවල දී, තැබිය හැකි ය. සංගමයේ මුද්‍රාව.

**12.** (අ) සංස්ථාවට ලැබෙන සහ සංස්ථාව විසින් වියදම් කරන සියලු මුදල් පිළිබඳ නිසි ගිණුම් පවත්වා ගෙන යාමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය. ගිණුම්.

(ආ) සංස්ථාවේ ගිණුම් යටත් පිරිසෙයින් සෑම වර්ෂයකට ම වරක් පරීක්ෂාකොට විගණනය කරනු ලැබිය යුතු අතර, ආදායම් සහ වියදම් ගිණුමේ සහ ශේෂ පත්‍රයේ නිරවද්‍යතාවය, සංස්ථාව විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයන් වන විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සහතික කරනු ලැබිය යුතු ය.

**13.** මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංගමයේ සියලු ණය සහ වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එකී දිනයේ දී සංගමය වෙත ගෙවනු ලැබිය යුතු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය. සංස්ථාවේ ණය.

**15.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ. ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.